# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය
### (නව නිර්දේශය)

### බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා BUCU – 28214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බුද්ධකාලීන බෞද්ධ පැවිද්දේ සිදු වූ නවීකරණ විෂයෙහි බලපෑ විවිධ සමාජ සාධක පරීක්ෂා කරන්න.

02. සංඝකර්ම හඳුන්වා දෙමින් බෞද්ධ සංඝකර්මයන්හි අනුගමනය කරන ප්‍රජාතාන්ත්‍රීය ලක්ෂණ පැහැදිලි කරන්න.

03. පුද්ගල චරිත ශෝධනයෙහි ලා ලබාගත හැකි පරමාදර්ශ තෝරාගත් බුද්ධකාලීන ප්‍රකට ශ්‍රාවක චරිතාපදාන හතරක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

04. සම්පත් කළමනාකරණය පිළිබඳ දැක්වෙන බුද්ධානුශාසනා විධිමත් ආරාම පරිපාලනයක් පවත්වාගෙන යාමෙහි ලා ඉවහල් වූ අයුරු මූලාශ්‍රයානුසාරයෙන් පහදන්න.

05. චුල්ලවග්ගපාලියේ සේනාසනක්ඛන්ධකය ඇසුරින් බෞද්ධ සංඝාරාම නිර්මාණයේ ප්‍රභවය හා ක්‍රමික විකාසය පිළිබඳ විවරණයක් සපයන්න.

06. කෘත්‍රිම ලෙන් නිර්මාණයේදී භාවිත වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ කවරේදැයි අජන්තා ලෙන් සංකීර්ණය ඇසුරෙන් පහදන්න.

07. මහායාන බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණයෙහි අනන්‍යතා ලක්ෂණ ශ්‍රී ලංකාවේ බෝධිසත්ත්ව ප්‍රතිමා ඇසුරෙන් විමර්ශනය කරන්න.

08. මහනුවර යුගයේ විහාර සිතුවම්වලට ආවේණික විශේෂතා පිළිබඳව ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

09. බෞද්ධ ස්තූපයේ ආරම්භය දක්වා, මෞර්ය ස්තූප කලාවෙහි දැකිය හැකි සුවිශේෂතා සනිදර්ශනව ප්‍රකට කරන්න.

10. වටදාගෙහි වාස්තුවිද්‍යාත්මක සහ කලාත්මක ලක්ෂණ අනුරාධපුර යුගයට අයත් වටදාගේ නිර්මාණ ඇසුරෙන් පරීක්ෂා කරන්න.

***********************************